**ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතුනිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ඒ.සී.ඒ- එෆ්) හි පුනරාවර්තන වියදම් යටතේ ඇති වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ හි එකතුව රු.104,734,316ක් ලෙස දක්වා ඇතත් එයට අදාල සටහන 05 හි අගයයන්හි එකතුව රු.99,956,727 ක් වේ. ඒ අනුව රු.4,777,589 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම අනෙකුත් භාණ්ඩ හා සේවා හි එකතුව රු.123,235,042 ක් ලෙස දක්වා ඇතත් එයට අදාල සටහන 06 හි අගයයන්හි එකතුව රු.128,012,631 ක් වේ. ඒ අනුව රු.4,777,589 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 2024.05.09 දිනැති පිළිතුර මගින් ඉදිරිපත් කර ඇත. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව වර්ගීකරණය කොට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර ඉදිරිපත් කළ යුතුවීම. |

**(ආ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවටප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බව දක්වා ඇති නමුත්,එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කිරීම<br><br>අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා මුදල් රෙගුලාසි 135 – 139 ප්‍රකාරව බලතල පැවරීම සිදුකරන ලදී. බලතල පැවරීම සහ කාර්ය මණ්ඩල අතර වැඩ අභ්‍යන්තර අධීක්ෂණයෙන් වන ආකාරය රාජකාරී පැවරීම සිදුකිරීම සහ අභ්‍යන්තර විගණන අංශය තුලින් අභ්‍යන්තර පාලන පද්ධතියක් බිහිකර ඇත.<br><br>එම අභ්‍යන්තර පාලන පද්ධතිය කාලීන අවශ්‍යතාවය මත හා අභ්‍යන්තර විගණනයේ පෙන්වා දීම මත කාලීන සමාලෝචනය සිදුකර අභ්‍යන්තර පාලන පද්ධතිය | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරන ලද බව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් දන්වා සිටිමි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 05ක ඇස්තමේන්තුගත එකතුව වූ රු.13,200,000ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.8,348,480ක් වූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 46ක සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | වැය විෂයය අංක 176-1-2-0-1403-0/11 හි ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් විදුලිය හා ජලය සඳහා බිල්පත් ඉදිරිපත් නොකිරීමත්, වැය විෂයය අංක 176-1-1-0-1302-0/11, 176-1-2-0-1205-0/11 හා 176-1-1-0-1403-0/11 හි අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීමත්, වැය විෂයය අංක176-1-1-0-1401-0/11 මණ්ඩලික නිලධාරින්ගෙන් බහුතරයක් ප්‍රවාහන දීමනාව ලබාගැනීම වෙනුවට රජයේ වාහන භාවිතය තොරා ගැනිම නිසා ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |
| (ආ) | වැය විෂයය 05ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එකතුව රු.310,200,000ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | වැය විෂයය අංක 176-1-1-0-1203-0/11 නිලධාරීන් නිලඇඳුම් දීමනාව ඉල්ලුම් නොකිරීම, වැය විෂයය අංක176-1-1-0-2002-0/11 යන්ත්‍ර උපකරණවල ප්‍රාග්ධන ස්වරූපයේ අළුත්වැඩියාවන් දැරීමට සිදුනොවීම, වැය විෂයය අංක 176-1-2-0-1508-0/11 අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදුනොවීම, වැය විෂයය අංක 176-2-4-21-2302-0/12 පූර්ව සුදුසුකම් ලේඛනය සහ ණය දීර්ඝ කිරීම සඳහා ඉන්දියාවේ EXIM බැංකුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින බැවින් ව්‍යාපෘතිය පුරෝකථනය කරන ලද විසර්ජන කාලසටහනට අනුව අයවැය ප්‍රතිපාදන භාවිතා නොකිරීම, වැය | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | විෂයය අංක 176-2-4-27-2506-0/11 ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන පවරා දුන්නද එම අමාත්‍යාංශය විසින් වියදම් ගිණුම්ගත කිරීම හේතු වී ඇත. | |
| (ඇ) | වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.70,101,520ක් වු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.61,109,314ක් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 30ක සිට සියයට 99ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | වැය විෂයය අංක 176-1-1-0-1403-0/11 අයවැය චක්‍රලේඛ 1/2023 අනුව රු.මිලියන 0.12 ක ප්‍රතිපාදන ඉතිරිකිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට බැඳී ඇත. තවද, අපේක්ෂිත පරිදි වර්ෂය තුලදී මෙම වැයවිෂයය යටතේ වියදම් දැරීමට සිදුවී නොමැත. වැය විෂයය අංක 176-1-2-0-1002-0/11 අයවැය චක්‍රලේඛ 1/2023 අනුව රු.මිලියන 1 ක ප්‍රතිපාදන ඉතිරිකිරීමද මෙම වැය විෂයයෙන් සිදුකර ඇත. අමාත්‍යාංශය ඒකාබද්ධ කිරීමේදී අනුමත කාර්යය මණ්ඩලය සීමා කිරීම නිසා නිලධාරීන් වෙනත් ආයතන වෙත අනුයුක්ත කිරීමද ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වු අතර 2023 වර්ෂයේ බැඳීම් වෙනුවෙන්ද මෙහි ප්‍රතිපාදන ඉතිරි කර ඇත. වැය විෂයය අංක 176-1-2-0-1203-0/11 අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම, වැය විෂයය අංක 176-1-2-0-1403-0/11 වරාය අධිකාරිය ගෙවීම් කිරීම සඳහා ජල හා විදුලි බිල්පත් ඉදිරිපත් නොකිරීම, සහ වැය විෂයය අංක 176-02-4-21-2506/17න් 2022 වර්ෂයේදී සිදු කරන ලද ගෙවීම් සඳහා රඳවා ගැනීමේ බද්ද සඳහා වූ රුපියල් මිලියන 6.1 ක මුදලක් උපදේශක වෙත මුදා හැර ඇත. එම නිසා 2023 වර්ෂය තුළ ව්‍යාපෘති ගෙවීම් නිකුත් කර නොමැත. ඒ නිසා බදු ගෙවීම් ද ඒ අනුව නිදහස් කර නොමැත. | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |
| (ඈ) | අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයය176-02-4-23-1509 ට අදාළව රු.119,550,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් සලසාගෙන තිබුණි. එම වැය | වැය විෂයය අංක 176 -02- 4-23-1509 2023/12/30 වන විට ගෙවිය යුතු ණය පොලිය සහ වාරික ගෙවීම සඳහා වෙන් කරන ලද | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | විෂයය යටතේ රු.131,356,467ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එය සලසාගෙන තිබූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 110ක් වී තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ නියමිත දිනට ගෙවීම් සිදු කිරීමට නොහැකි වුවහොත් ගෙවිය යුතු මුදලට අමතරව දඩ මුදලක්ද ගෙවීමට සිදු වීම හේතු වී ඇත. | |
| (ඉ) | 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අයවැය ඇස්තමේන්තු මගින් කාර්මික උද්‍යාන/ කලාප සඳහා යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් 176-02-4-27-2506 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන රු.10,000,000ක් වර්ෂය අවසාන වන තෙක්ම උපයෝජනය කර නොතිබුණි. | මෙම ප්‍රතිපාදන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට පවරා ඇත. | ලබා දුන් ප්‍රතිපාදනයන් ඉතිරි වීම් සම්බන්ධයෙන් විමසා පියවර ගත යුතු වීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමෙන් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් හා බැරකම් වලට එළඹීම වලක්වාලීමේ අරමුණින් නිකුත් කරන ලද 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි (ආ) හි දැක්වෙන පරිදි, හඳුනාගනු ලැබූ බැඳීම් පදනම් කරගෙන එම බැඳීම් වලට අදාළ භාණ්ඩ හෝ සේවා ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල හා එළඹෙන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සහතික කල වැඩ වල වටිනාකම බැරකමක් ලෙස සටහන් කල යුතු බව දක්වා ඇත. එසේ වුවද, 2024 ජනවාරි හා පෙබරවාරි වවුචර්පත් පරීක්ෂාවේදී 2023 වර්ෂය සඳහා වූ බැරකම් අවස්ථා 110කට අදාළව රු.3,088,383ක් මෙම මුල් මාසයන්හි දී නිරවුල් කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශ කට්ටලය තුල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස ඇතුලත් කර තිබුණේ රු.1,561,914.71 වටිනාකමට අදාල බැරකම් පමණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැරකම් රු.1,526,468 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 04/2023 වෙත ඔබගේ අවධානය යොමු කරනු ලබන අතර එහි සඳහන් වන පරිදි දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2024.01.30 දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතුය. එබැවින් 2024.01.30 දිනට පසුව (අවසන් පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීමෙන් පසුව) ගිණුම් අංශය වෙත ලැබෙන වවුචර්පත් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේ හැකියාවක් නොමැත. | අතිකාල, ගමන් වියදම්, වෙනත් දීමනා, ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා, තැපැල් හා සන්නිවේදන යන වැය විෂයයන් බැඳීම් වලට අදාල වන බැවින් එම ගෙවිය යුතු මුදල් කලින් හඳුනා ගත යුතුවීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 1645 | දෙපාර්තමේන්තු වාහන මාණ්ඩලික නිලධාරියකු හෝ වගකිවයුතු නිලධාරියකු හෝ භාරයේ තැබිය යුතු අතර එම නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රය පරිදි වාහන ලොග් සටහන් පොතක් තබාගෙන නිතිපතා එහි සටහන් ලිවිය යුතුය. දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර, වාහනයේ භාරකාරත්වය මාරුකිරිම, ගමන් පිළිබඳ මාසික සාරාංශ සටහන්, පරීක්ෂක නිලධාරින්ගේ සටහන් පිළිබඳ විස්තර අසම්පූර්ණ වූ අතර යාවත්කාලීනව පවත්වාගෙනද ගොස් නොතිබුණි. | මෙම අමාත්‍යාංශයට අයත් වාහන 42 සඳහාම 267 වැනි පොදු ආකෘතිය පරිදි වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යනු ලබන අතර ඉහත විගණන විමසුමෙහි සඳහන් වාර්ෂික බලපත්‍ර පිළිබඳව සටහන් මේ වනවිටත් යාවත්කාලීන කරමින් පවතින බව කාරුණිකව සඳහන් කරන අතර එහි සඳහන් දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාහනයේ භාරකාරීත්වය මාරු කිරීම, ගමන් පිළිබඳව මාසික සාරාංශ හා පරීක්ෂක නිලධාරීන්ගේ සටහන් 2024 මැයි මස සිට යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 12ක කාලසීමාවකට වරක් හෝ කි.මී.25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව වාහනවල ඉන්ධන දහනය | අමාත්‍යාංශය සතු යතුරු පැදි 02 සහ තවත් වාහන කිහිපයක ඉන්ධන පරීක්ෂාව සිදු කර තිබෙන අතර අමාත්‍යාංශය සතු වාහන බහුතරයක් නගර සීමාව තුළ පමණක් ධාවනය වීම හේතුවෙන් උක්ත චක්‍රලේඛයේ 3.1 අනුව නගරය තුළ සහ පිටත කිලෝමීටර 80 සීමාව | 2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව ක්‍රියාකළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | වීම නැවත පරික්ෂාවක් කල යුතු බව දක්වා ඇතත් 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ වාහන සඳහා එම චක්‍රලේඛය අනුව ඉන්ධන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | යන නිර්ණායකයන්ට අනුකූලව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමේ ගැටවළුවලට සුදුසු විකල්ප යොදා ගනිමින් එම කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ පරිපාලන නිලධාරී හා ප්‍රවාහන නිලධාරී මඟින් සිදු කරමින් පවති. | |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 01 ඡේදය | කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම් සඳහා ආයතනයට සුදුසු ලෙස සකස් කරනු ලබන වාර්ෂික කාර්යසාධන ගිවිසුම් ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදු කලයුතු වේ. එසේ වුවද අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සිදුකර නොතිබුණි. | වර්ෂයට අදාළ කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර එයට හේතු පහත පරිදි ඉදිරිපත් කරමි.<br><br>02/2018 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයෙහි දක්වා ඇති කාර්ය සාධන ගිවිසුම් ආකෘති පත්‍ර අනුව නිලධාරියෙකුගේ කාර්ය සාධන ඇගයීම වර්ෂය ආරම්භයේදී සිදු කිරීමට අපහසු වන අතර කාර්ය සාධන ගිවිසුමට එළඹීම වර්ෂය අවසානයේදී සිදු කිරීමට නොහැකි බව පෙනේ.<br><br>එබැවින් 2023 වර්ෂයට අදාළ කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොමැති අතර, ඉදිරියේදී එම චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව මෙම අමාත්‍යාංශයට ගැලපෙන පරිදි කාර්ය සාධන ආකෘති පත්‍ර සංශෝධනය කර 2024 වර්ෂය සඳහා කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව ක්‍රියාකළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 මැයි 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (විශේෂ) අංක 1550/7 අතිරේක සාමාන්‍ය ගැසට් පත්‍රයේ 07 සහ 08 රෙගුලාසි අනුව, ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශපත්‍රයක් සම්බන්ධයෙන්ම ඇමෙරිකානු ඩොලර් 60ක අධිභාරයක් (OSS Levy) හෝ එම මුදලට සමාන මුදලක් අය කළ යුතු අතර, එසේ අය කරනු ලබන අධිභාරය, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව දක්වා ඇතත් 2008 සිට 2024 මාර්තු දක්වා කාලය තුළ එකතු කරන ලද රු.22,113,189,430 ක් වූ අධිභාරය සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. | "ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වියදම් සඳහා අරමුදල් සපයා ගැනීම" යන මැයෙන් වරාය නාවික හා ගුවන් සේවා හා නාවික ඇමතිතුමා ඉදිරිපත් කළ 2024.01.30 දිනැති සංදේශයට අදාලව 2024.02.19 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයට අනුව විදේශීය විකුණුම් අධිභාර ආදායම ඒකාබද්ධ අරමුදලට 2024.05.10 දින බැර කර ඇත. | තම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් රජයට ලැබිය යුතු ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු ආනයන හා අපනයන Exim බැංකුව අතර ඇමරිකානු ඩොලර් මිලියන 45.27ක ණය මුදලක් ලබා ගැනීමට ඩොලර් ණය ගිවිසුමකට 2018 ජනවාරි 10 දින අත්සන් තබා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුම අත්සන් කර වසර 04 කටත් වැඩි කාලයක් ගතවී ඇතත් වරායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. එසේම, එම ණය මුදලට අදාළව රජය විසින් දැරිය යුතු ගෙවීම් සඳහා 2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුල කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 360ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් ඉන් කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව ප්‍රතිපාදනය සියයට 100 ඉතිරිව තිබුණි. | පූර්ව සුදුසුකම් ලේඛනය සහ ණය දීර්ඝ කිරීම සඳහා ඉන්දියාවේ EXIM බැංකුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින බැවින් ව්‍යාපෘතිය 2023 වර්ෂයේදී නැවතී ඇත. එබැවින් පුරෝකථනය කරන ලද විසර්ජන කාලසටහනට අනුව අයවැය ප්‍රතිපාදන භාවිතා කිරීමට නොහැකි වීඇත. | සැලසුම් සකස් කර ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය විය හැකි නිශ්කාෂණයන් සහ අනුකූලතාවයන් පිළිබඳ පූර්ව සලකා බැලීමක් කළ යුතු වීම. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 06 දින PG 9548 දරන කැබ් රථය අනතුරකට භාජනය වී තිබූ අතර එහි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.587,480ක මුදලක් වැයකර තිබුණි. එහෙත් රක්ෂණ ආයතනය විසින් ගෙවීමට එකඟ වී තිබුණේ රු.250,000ක මුදලක් පමණි. වාහනය අනතුරට භාජනය වීමෙන් වූ හානිය ප්‍රතිපූර්ණය කර ගැනිම සඳහා රක්ෂණ ආයතනයෙන් පූර්ණ වන්දි මුදල් ලබාගැනිමට හෝ රියදුරු විසින් ගෙවා පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට තිබිය යුතු කොන්දේසි හෝ සපුරා නොතිබීම හේතුවෙන් රජයට රු.337,480ක පාඩුවක් සිදුවී තිබුණි. | 2022.04.06 දින PG- 9548 කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා වූ රු.587,480 මුදලින් රක්ෂණ හිමිකම් වශයෙන් රු.250,000 මුදලක් ලැබීමත් අනතුරුව ඉහත අළුත්වැඩියාව සඳහා වැයවූ හිඟ මුදලවන රු.337,480 මුදල අය කර ගැනීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමෙන් අනතුරුව මු.රෙ. 108 හා 109 අනුව එම හිඟ මුදල හානි හා පාඩු ලෙස කපාහැරීමට කටයුතු කර ඇත. | රියදුරන් වෙත රාජකාරී පැවරීමේදී වාහනය විධිමත් අයුරින් භාරදීමට කටයුතු කළ යුතු වීම. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තොබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණයශේෂ මාස 03ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙන් බාහිර ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරින් දෙදෙනෙකුට අයත් වර්ෂ 20කට අධික කාලයක සිට පැවැත එන එකතුව රු.119,200ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2023.12.31 දින වන විටත් අයකර ගැනීමට නොහැකිව තිබූ ස්ථානමාරුවී ගිය දිනය නිශ්චිතව සඳහන් නොවන නිලධාරීන් 2 දෙනෙකුගෙන් අයවිය යුතු රු.119,200 ක් වූ ණය ශේෂ 1990 දශකය තරම් පැරණිය. එම ණය ශේෂ කපාහැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරන ලද අතර එහි නිර්දේශය අනුව ණය ශේෂය කපාහැරීමට කමිටුවක් පත්කර කරුණු අධ්‍යයනය කර කමිටු වාර්තාව 2019.10.18 දින ඉදිරිපත් කරන ලදි. අවසන් වරට 2023.11.01 දිනැතිව මෙම ණය ශේෂ කපාහැරීමට උපදෙස් පතා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට තොරතුරු ඉදිරිපත් කරන ලදි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැඩ තහනම් කර තිබුණු නිලධාරියෙකුගෙන් අමාත්‍යාංශය වෙත අය විය යුතුව තිබුණු රු.293,470ක ණය ශේෂය වර්ෂ 20කට අධික කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. මෙම නිරවුල් නොවූ ණය ශේෂයන් දිගින් දිගටම ණය ලේඛනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | වැඩ තහනමකට ලක්වී ඇති නිලධාරියෙකුගෙන් අයවීමට නියමිත රු.293,470 ක ණය ශේෂය ඒ මහතාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් මහාධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුව මත එම නිලධාරියා අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩුව සමතයකට පත්වී ඔහුට හිමි පාරිතෝෂිකය ගෙවීමට සිදුවුවහොත් අයකර ගැනීමට සූදානම්ව සිටියද 2022.03.08 දින පැවති නඩුවේ තීන්දුව අනුව ඔහු වරදකරු ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. එබැවින් මෙම ණය ශේෂය අයකර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මේ වන විට අධ්‍යයනය කරමින් පවතී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**3.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේ ඉදිකරන ලද සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු ණය පියවීම සඳහා 2017 දෙසැම්බර් 14 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මහජන බැංකුවෙන් ලබාගන්නා ලද රු.3,950,858,870 ණය මුදලට වාර්ෂිකව සියයට 33.30 ක පොලියත් (පොලි අනුපාතය වෙනස්වේ) සමග වසර 15 ක කාලයක් තුළ ගෙවිය යුතු වන රු.11,796,877,071 ක් ගෙවීම සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල තීරණ මගින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ සිට ණය පොලී ගෙවීමටත් 2021 වර්ෂයේ සිට ණය පොලි හා වාරික ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් මෙම අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ණය වාරික හා පොලී වශයෙන් රු.991,193,533 ක මුදලක් අමාත්‍යාංශයේ බැංකු පොලී හා මූල්‍ය වියදම් | හම්බන්තොට වරාය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ අතිරේක වැඩක් ලෙස සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සිදුකර ඇත. ඒ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු හිඟ මුදල් නොගෙවීම නිසා කොන්ත්‍රාත්කරු ණය බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් තිබූ බැවින් එය අවලංගු කර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක MNPEA/2017/132 හා 2017.10.04 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, එවකට පැවති මුදල් හා ජනමාධ්‍ය අමාතශංශය සහ වරාය හා නාවික අමාත්‍යාංශයේ අංක MNPEA/2017/158 හා | අමාත්‍යාංශයේ අරමුණුවලට අනුකූල නොවන කටයුතු සඳහා ප්‍රතිපාදන උපයෝජනය නොකල යුතු බවට නිලධාරීන් වග බලා ගත යුතුය. |

ලෙස වැය විෂයය - 176–2–4 – 23 1509 ii (ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සූරියවැව, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය - රාජ්‍ය ආයතන) යටතේ ගෙවීම් කර තිබුණි. මෙම වියදම අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදමෙන් සියයට 73.62 ක්, ප්‍රාග්ධන වියදමෙන් සියයට 26.99 ක් හා මුළු වියදමින් සියයට 46.62 ක් විය.

මෙම ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකර ඇති ඉඩම 2011 අප්‍රේල් 26 දින රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරා ඇති නමුත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශට එහි කිසිදු අයිතියක් නොමැත. මේ අනුව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ දරන ලද මෙම වියදම අමාත්‍යාංශයේ අරමුණු හා ක්‍රියාකාරකම්වලට අනුකූල නොවී තිබුණි.

2017.11.20 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල තීරණ මගින් ගෙවීම් කිරිම සඳහා රු.3,950,856,870 ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මහජන බැංකුවෙන් ලබාගෙන ඍජුවම කොන්ත්‍රාත්කරුට ගෙවීමට අනුමැතිය දී තිබුණි. එම ණය මුදල හා පොලිය වසර 15 ක් තුල ගෙවීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන මුදල් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දිමට නියමිත විය. ඒ අනුව 2018 වර්ෂයේ සිට ණය පොලී ගෙවීමටත් 2021 වර්ෂයේ සිට ණය පොලී හා වාරික ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් මෙම අමාත්‍යාංශය වෙත සලසා දී ඇත.